

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 - 68

# බුදු සරණ

රාජ්‍ය වර්ෂ 2024

## 2024 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

### දෙළොස් මහේ පොහොය වරුණ

**දුරුතු පසළොස්වක පොහොය**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනක ය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සදහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

**නවම් පසළොස්වක පොහොය**

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුන් පොහෝ දිනක ය.

**මැදින් පසළොස්වක පොහොය**

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

**බක් පසළොස්වක පොහොය**

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි, බක් පොහොය දිනය.මේ සුන්දර දිවයින දෙවැනි වරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද, දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද බක් පුර පොහෝ දිනක දී ය.

**වෙසක් පසළොස්වක පොහොය**

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය ආගමික දිනය යි.

**පොසොන් පසළොස්වක පොහොය**

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවුඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් පොහොය දිනය යි.

### උඳුවප් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| ජන: 03 | බදාදා අ.භා. 07.48 | අව අටවක ලබා | 04 බ්‍රහස්: | අ.භා. 10.03 ගෙවේ | 04 බ්‍රහස්: සිල් |
| ජන: 10 | බදාදා අ.භා. 08.08 | අමාවක ලබා | 11 බ්‍රහස්: | අ.භා. 05.25 ගෙවේ | 11 බ්‍රහස්: සිල් |

### දුරුතු මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| ජන: 17 | බදාදා අ.භා. 10.12 | පුර අටවක ලබා | 18 බ්‍රහස්: | අ.භා. 08.50 ගෙවේ | 18 බ්‍රහස්: සිල් |
| ජන: 24 | බදාදා අ.භා. 09.54 | පුර පසළොස්වක ලබා | 25 බ්‍රහස්: | අ.භා. 11.27 ගෙවේ | 25 බ්‍රහස්: සිල් |
| පෙබ: 02 | සිකුරා අ.භා. 04.00 | අව අටවක ලබා | 03 සෙන: | අ.භා. 05.17 ගෙවේ | 02 සිකුරා: සිල් |
| පෙබ: 09 | සිකුරා පූ.භා 08.03 | අමාවක ලබා | 10 සෙන: | පූ.භා. 04.30 ගෙවේ | 09 සිකුරා: සිල් |

### නවම් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| පෙබ: 16 | සිකුරා පූ.භා. 08.59 | පුර අටවක ලබා | 17 සෙන : | පූ.භා. 08.20 ගෙවේ | 16 සිකුරා: සිල් |
| පෙබ: 23 | සිකුරා අ.භා. 03.37 | පුර පසළොස්වක ලබා | 24 සෙන: | අ.භා. 06.03 ගෙවේ | 23 සිකුරා: සිල් |
| මාර්තු 03 | ඉරිදා පූ.භා. 08.44 | අව අටවක ලබා | 04 සඳුදා | පූ.භා. 08.48 ගෙවේ | 03 ඉරිදා සිල් |
| මාර්තු 09 | සෙන අ.භා. 06.18 | අමාවක ලබා | 10 ඉරිදා | අ.භා. 02.32 ගෙවේ | 10 ඉරිදා සිල් |

### මැදින් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| මාර්තු 16 | සෙන. අ.භා. 09.45 | පුර අටවක ලබා | 17 ඉරිදා | අ.භා. 09.59 ගෙවේ | 17 ඉරිදා සිල් |
| මාර්තු 24 | ඉරිදා පූ.භා. 09.56 | පුර පසළොස්වක ලබා | 25 සඳුදා | අ.භා. 12.31 ගෙවේ | 24 ඉරිදා සිල් |
| අප්‍රේල් 01 | සඳුදා අ.භා. 09.07 | අව අටවක ලබා | 02 අඟහ: | අ.භා. 08.05 ගෙවේ | 02 අඟහ: සිල් |
| අප්‍රේල් 08 | සඳුදා පූ.භා. 03.23 | අමාවක ලබා | එදිනම | අ.භා. 11.53 ගෙවේ | 08 සඳුදා සිල් |

### බක් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් 15 | සඳුදා අ.භා. 12.17 | පුර අටවක ලබා | 16 අඟහ: | අ.භා. 01.29 ගෙවේ | 15 සඳුදා සිල් |
| අප්‍රේල් 23 | අඟහ පූ.භා. 03.27 | පුර පසළොස්වක ලබා | 24 බදාදා | පූ.භා. 05.20 ගෙවේ | 23 අඟහ: සිල් |
| මැයි 01 | බදාදා පූ.භා. 05.48 | අව අටවක ලබා | 02 බ්‍රහස්: | පූ.භා. 04.02 ගෙවේ | 01 බදාදා සිල් |
| මැයි 07 | අඟහ පූ.භා. 11.44 | අමාවක ලබා | 08 බදාදා | පූ.භා. 08.55 ගෙවේ | 07 අඟහ: සිල් |

### වෙසක් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| මැයි 15 | බදාදා පූ.භා. 04.22 | පුර අටවක ලබා | 16 බ්‍රහස් : | පූ.භා. 06.25 ගෙවේ | 15 බදාදා සිල් |
| මැයි 22 | බදාදා අ.භා. 06.46 | පුර පසළොස්වක ලබා | 23 බ්‍රහස්: | අ.භා. 07.20 ගෙවේ | 23 බ්‍රහස්: සිල් |
| මැයි 30 | බ්‍රහස් පූ.භා. 11.44 | අව අටවක ලබා | 31 සිකුරා: | පූ.භා. 09.39 ගෙවේ | 30 බ්‍රහස්: සිල් |
| ජුනි 05 | බදාදා අ.භා. 07.59 | අමාවක ලබා | 06 බ්‍රහස්: | අ.භා. 06.13 ගෙවේ | 06 බ්‍රහස්: සිල් |

### පොසොන් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| ජුනි 13 | බ්‍රහස් අ.භා. 09.37 | පුර අටවක ලබා | 15 සෙන: | පූ.භා. 00.06 ගෙවේ | 14 සිකුරා: සිල් |
| ජුනි 21 | සිකුරා පූ.භා. 07.32 | පුර පසළොස්වක ලබා | 22 සෙන: | පූ.භා. 06.38 ගෙවේ | 21 සිකුරා: සිල් |
| ජුනි 28 | සිකුරා අ.භා. 04.30 | අව අටවක ලබා | 29 සෙන: | අ.භා. 02.23 ගෙවේ | 28 සිකුරා: සිල් |
| ජූලි 05 | සිකුරා පූ.භා. 05.00 | අමාවක ලබා | 06 සෙන: | පූ.භා. 04.29 ගෙවේ | 05 සිකුරා: සිල් |

### ඇසළ මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| ජූලි 13 | සෙන. අ.භා. 03.06 | පුර අටවක ලබා | 14 ඉරිදා | අ.භා. 05.25 ගෙවේ | 13 සෙන: සිල් |
| ජූලි 20 | සෙන. අ.භා. 05.57 | පුර පසළොස්වක ලබා | 21 ඉරිදා | අ.භා. 03.45 ගෙවේ | 20 සෙන: සිල් |
| ජූලි 27 | සෙන. අ.භා. 09.24 | අව අටවක ලබා | 28 ඉරිදා | අ.භා. 07.32 ගෙවේ | 28 ඉරිදා සිල් |
| අගෝ: 03 | සෙන. අ.භා 03.56 | අමාවක ලබා | 04 ඉරිදා | අ.භා. 04.48 ගෙවේ | 03 සෙන: සිල් |

### නිකිණි මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| අගෝ: 12 | සඳුදා පූ.භා. 07.55 | පුර අටවක ලබා | 13 අඟහ: | පූ.භා. 09.30 ගෙවේ | 12 සඳුදා සිල් |
| අගෝ: 19 | සඳුදා පූ.භා. 03.05 | පුර පසළොස්වක ලබා | එදිනම | අ.භා. 11.55 ගෙවේ | 19 සඳුදා සිල් |
| අගෝ: 26 | සඳුදා පූ.භා 03.42 | අව අටවක ලබා | 27 අඟහ: | පූ.භා. 02.23 ගෙවේ | 26 සඳුදා සිල් |
| සැප්: 02 | සඳුදා පූ.භා. 05.23 | අමාවක ලබා | 03 අඟහ: | පූ.භ. 07.27 ගෙවේ | 02 සඳුදා සිල් |

### බිනර මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| සැප්: 10 | අඟහ. අ.භා. 11.10 | පුර අටවක ලබා | 11 බදාදා | අ.භා. 11.44 ගෙවේ | 11 බදාදා සිල් |
| සැප්: 17 | අඟහ. පූ.භා. 11.44 | පුර පසළොස්වක ලබා | 18 බදාදා | පූ.භා. 08.06 ගෙවේ | 17 අඟහ: සිල් |
| සැප්: 24 | අඟහ. අ.භා. 12.45 | අව අටවක ලබා | 25 බදාදා | අ.භා. 12.17 ගෙවේ | 24 අඟහ: සිල් |
| ඔක්: 01 | අඟහ. අ.භා. 09.42 | අමාවක ලබා | 03 බ්‍රහස් : | පූ.භා. 00.20 ගෙවේ | 02 බදාදා සිල් |

### වප් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| ඔක්: 10 | බ්‍රහස්. අ.භා. 12.29 | පුර අටවක ලබා | 11 සිකුරා: | අ.භා. 12.04 ගෙවේ | 10 බ්‍රහස්: සිල් |
| ඔක්: 16 | බදාදා. අ.භා. 08.41 | පුර පසළොස්වක ලබා | 17 බ්‍රහස් : | අ.භා. 04.58. ගෙවේ | 17 බ්‍රහස්: සිල් |
| ඔක්: 24 | බ්‍රහස්. පූ.භා. 01.24 | අව අටවක ලබා | 25 සිකුරා: | පූ.භා. 02.03. ගෙවේ | 24 බ්‍රහස්: සිල් |
| ඔක්: 31 | බ්‍රහස්. අ.භා. 03.53 | අමාවක ලබා | නොවැ:01 සිකුරා: | අ.භා. 06.16 ගෙවේ | 31 බ්‍රහස්: සිල් |

### ඉල් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| නොවැ: 08 | සිකුරා අ.භා. 11.55 | පුර අටවක ලබා | 09 සෙන: | අ.භා. 10.43 ගෙවේ | 09 සෙන: සිල් |
| නොවැ: 15 | සිකුරා පූ.භා. 06.21 | පුර පසළොස්වක ලබා | 16 සෙන: | පූ.භා. 03.00 ගෙවේ | 15 සිකුරා: සිල් |
| නොවැ: 22 | සිකුරා අ.භා. 06.14 | අව අටවක ලබා | 23 සෙන: | අ.භා. 08.02 ගෙවේ | 23 සෙන: සිල් |
| නොවැ: 30 | සෙන පූ.භා. 10.29 | අමාවක ලබා | දෙසැ: 01 ඉරිදා | පූ.භා 11.50 ගෙවේ | 30 සෙන: සිල් |

### උඳුවප් මස පෝය

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙසැ: 08 | ඉරිදා පූ.භා. 09.44 | පුර අටවක ලබා | 09 සඳුදා | පූ.භා. 08.03 ගෙවේ | 08 ඉරිදා සිල් |
| දෙසැ: 14 | සෙන. අ.භා. 05.02 | පුර පසළොස්වක ලබා | 15 ඉරිදා | අ.භා. 02.36 ගෙවේ | 14 සෙන: සිල් |
| දෙසැ: 22 | ඉරිදා අ.භා. 02.36 | අව අටවක ලබා | 23 සඳුදා | අ.භා 05.10 ගෙවේ | 22 ඉරිදා සිල් |
| දෙසැ: 30 | සඳුදා පූ.භා. 04.02 | අමාවක ලබා | 31 අඟහ: | පූ.භා. 03.57 ගෙවේ | 30 සඳුදා සිල් |

### දෙළොස් මහේ පොහොය වරුණ

**ඇසළ පසළොස්වක පොහොය**

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනය යි, ඇසළ පෝදා.

**නිකිණි පසළොස්වක පොහොය**

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයකි. නිකිණි පසළොස්වක පොහෝදා පොහොය කොට නිකිණි අව පෑළවිය, පසුවස් එළඹීම යි,සසුන් පිළිවෙත වන්නේ.

**බිනර පසළොස්වක පොහොය**

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වස් වසමින් බණ භාවනාවල යෙදෙමින් සම්බුද්ධ ශාසන පරමාර්ථ ඉටු කර ගන්නා කාලයකි. මෙහෙණ සසුනේ ආරම්භය සිදුවිය.

**වප් පසළොස්වක පොහොය**

වස්සාන ඍතුවේ මුල් තුන් මස භික්ෂූන් වහන්සේ වස් වසා වැඩ සිටින කාලය යි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසය යි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

**ඉල් පසළොස්වක පොහොය**

ශාසනික ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෛත්‍රී බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම, පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

**උඳුවප් පසළොස්වක පොහොය**

උඳුවප් පොහොය දින සිදු වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන, ලංකා මෙහෙණ සසුන ගැන සිහි කරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ල කි.

ජූලි 21 වැනි ඉරිදා පෙරවස් එළඹීම
අගෝ. 20 වැනි අඟහරුවාදා පසුවස් එළඹීම
ඔක්. 17 වැනි බ්‍රහස්පතින්දා පෙරවස් පවාරණය
නොවැ. 15 වැනි සිකුරාදා පසුවස් පවාරණය

වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් 26 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

සමන් ශ්‍රීකාන්ත